# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 202 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 04/02/2024 පැය 1255

## මාධ්‍ය නිවේදනය

### භූගත නල එළීමක් හේතුවෙන් මාර්ගය තාවකාලිකව වසා තැබීමක් සම්බන්ධයෙන් - රථ වාහන මූලස්ථානය.

කොල්ලුපිටිය හා කොම්පඤ්ඤ වීදිය පොලිස් වසම් වල උත්තරානන්ද මාවත, පෙරහර මාවත හා නවම් මාවත ඔස්සේ කොළඹ වරාය නගරය දක්වා සම්බන්ධ කිරීමට නියමිත අප ජල පද්ධතියට අදාල නල මාර්ග භූගතව එළීම අදියර 03 ක් යටතේ සිදු කිරීමට නියමිතව ඇති බව නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් දැනුම් දීමක් කර ඇත.

ඒ අනුව භූගත නල එළීමේ කටයුතු අදියර 03ක් යටතේ සිදු කිරීමට නියමිත බැවින් එම කාලයන් තුල උත්තරානන්ද මාවත, පෙරහර මාවත හා නවම් මාවත තාවකාලිකව වසා දැමීමට සිදු වන අතර එම මාර්ගය වසා තබන කාලය තුල අවට පදිංචිකරුවන් අවස්ථානාකූලව මාර්ගය භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බවද දන්වා සිටී.

මාර්ගය වසා තබනු ලබන කාල පරාසයන් :

01. 2024.02.05 වන දින සිට 2024.02.19 වන දින දක්වා උත්තරානන්ද මාවත, නවම් මාවත සිට දුම්රිය හරස් මාර්ගය දක්වා කොටස.
02. 2024.02.20 වන දින සිට 2024.03.04 වන දින දක්වා උත්තරානන්ද මාවත, පෙරහර මාවත සිට නවම් මාවත දක්වා.
03. 2024.03.05 වන දින සිට 2024.03.11 වන දින දක්වා උත්තරානන්ද මාවත, පෙරහර මාවත, රොටුන්ඩාගාඩ්න් සන්දිය දක්වා.

ඉහත කාලය තුළ රියදුරන් හැකිතාක් විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**